## ප්‍රසිද්ධ රඟදැක්වීමේ බලපත්‍රය ලබා ගැනීමට අදාළ කොන්දේසි :

**නාට්‍ය, මුද්‍රා නාට්‍ය, රූකඩ දැක්ම....**

- ✤ විනෝද බදු අය වීමට යටත් නොවේ.
- ✤ ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ සහතිකය ඉදිරිපත් කළ යුතුයි.
- ✤ දිනකට රුපියල් 500.00 + වැට් බද්ද හා එන්. බී. ටී. බද්ද සහිතව බලපත්‍ර ගාස්තු ගෙවිය යුතු ය. (ඉදිරිපත් කරනු ලබන සෑම දර්ශන වාරයක් වෙනුවෙන් ම බලපත්‍ර ගාස්තු අය කෙරේ.)

**සංදර්ශනය සඳහා සහභාගී වන සියලු ම පුද්ගලයන් ආධුනිකයන් වන විට....**

- ✤ පළමු සංදර්ශන 10 සඳහා විනෝද බදු සහන හිමිකම ලැබේ.
- ✤ ජාතික කලා මණ්ඩලය මඟින් ඉදිරිපත් කරනු ලබන සහතිකය හා ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ සහතිකය ඉදිරිපත් කළ යුතු ය (මුල් පිටපත්).
- ✤ ආයතනයක් හැර යම් පුද්ගලයකු විසින් අදාළ සංදර්ශනය සංවිධානය කරන්නේ නම්, ඔහුගේ/ඇයගේ හැඳුනුම් පත ඉදිරිපත් කළ යුතු ය.
- ✤ බලපත්‍රය ලබා ගැනීමට අදාළ අයැදුම්කරු ම ඉදිරිපත් විය යුතු ය.
- ✤ දිනකට රුපියල් 500.00 + වැට් බද්ද හා එන්. බී. ටී. බද්ද සහිතව බලපත්‍ර ගාස්තු ගෙවිය යුතු ය. (ඉදිරිපත් කරනු ලබන සෑම දර්ශන වාරයක් වෙනුවෙන් ම බලපත්‍ර ගාස්තු අය කෙරේ.)
- ✤ සංදර්ශනය වෙනුවෙන් මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍රයක ආකෘතියක් හෝ ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

**අනෙකුත් සංදර්ශන හා ක්‍රීඩා තරග....**

- ✤ විනෝද බදු අය වීමට යටත් වේ.
- ✤ ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ සහතිකය ඉදිරිපත් කළ යුතුයි (ක්‍රීඩා තරග හැර).
- ✤ ආයතනයක් හැර යම් පුද්ගලයකු විසින් අදාළ සංදර්ශනය හෝ ක්‍රීඩා තරගය සංවිධානය කරන්නේ නම්, ඔහුගේ/ඇයගේ හැඳුනුම් පත ඉදිරිපත් කළ යුතු ය.
- ✤ විකුණනු ලබන සියලු ප්‍රවේශ පත්‍රවල පූර්ණ විස්තරයක් කාර්යාලය විසින් සපයනු ලබන නියමිත ආකෘති පත්‍රිකාව මඟින් ඉදිරිපත් කළ යුතු ය (අදාළ ප්‍රවේශ පත්‍ර මුද්‍රණය කළ මුද්‍රණාල හිමිකරු විසින් මුද්‍රණාලයේ රබර් මුද්‍රාව සහ දුරකථන අංක සහිතව ඉදිරිපත් කළ යුතු ය).
- ✤ විනෝද බදු ලෙස මුළු ප්‍රවේශ පත්‍ර වටිනාකමින් සියයට 10 ක් සහ වැට් බදු හා එන්. බී. ටී. බදු ගෙවිය යුතු ය.
- ✤ ආරාධිතයන් සඳහා ලබා දිය හැක්කේ මුළු ආසන සංඛ්‍යාවෙන් සියයට 5 ක ප්‍රමාණයක් පමණි. ඔවුනට ලබා දෙන සියලු ම ප්‍රවේශ පත්‍ර හෝ ආරාධනා පත්‍ර නගර සභාවට ඉදිරිපත් කළ යුතු ය.
- ✤ සියලු ම ප්‍රවේශ පත්‍ර උප පත්‍රිකාවකින් සමන්විත විය යුතු ය. එහි ;

  I. දිනය II. අනුක්‍රමික අංකය III. වටිනාකම
  IV. සංදර්ශනයේ නම V. පැවැත්වෙන ස්ථානය VI. වේලාව.

  අනිවාර්යයෙන් ම සටහන් විය යුතු ය.

- ✤ ආධාර දර්ශනයක් නම්, ඒ පිළිබඳව ප්‍රවේශ පත්‍රයේ සඳහන් විය යුතු ය.
- ✤ **කුමන අයුරකින්වත් ප්‍රවේශ පත්‍රයේ මුදල වෙනස් නොකළ යුතු ය.**
- ✤ විකිණීමට බලාපොරොත්තු වන සියලු ම ප්‍රවේශ පත් කාර්යාලයීය මුද්‍රාව තැබීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.
- ✤ දිනකට රුපියල් 500.00 + වැට් බද්ද හා එන්. බී. ටී. බද්ද සමඟ බලපත්‍ර ගාස්තු හා අදාළ විනෝද බදු මුදල් ගෙවා බලපත්‍රය ලබාගෙන එය සංදර්ශනය හෝ ක්‍රීඩා තරගය පවත්වන ස්ථානයට ලබා දිය යුතු ය.
- ✤ සියලු ම සංවිධායකයන් විසින් දින තුනකට ප්‍රථම අදාළ කාර්යයන් සඳහා තරගයෙන් හෝ සංදර්ශනයෙන් ලැබෙන දළ හෝ ශුද්ධ ආදායම යොදවන බවට "අ" පෝරමය මඟින් ඉදිරිපත් කළ යුතු ය.
- ✤ ආධාර ලබා දීමට නියමිත ආයතනය සභා සීමාවෙන් පිටත පිහිටා ඇත් නම්, විනෝද බදු සහන සඳහා වූ අයැදුම් පත අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් මඟින් ඉදිරිපත් කළ යුතු ය.